| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 2698475<br>) 2698490<br>) 2698507 | මගේ අංකය<br>எனது இல<br>My No. | )<br>) NCCP/GOSL/12/2019<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 2692913<br>) 2693869<br>) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )<br>) postmaster@health.gov.lk<br>) | දිනය<br>திகதி<br>Date | )<br>) 20/05/2019<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | )<br>) www.health.gov.lk<br>) | | |

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
**Ministry of Health, Nutrition & Indigenous Medicine**


චක්‍රලේඛ ලිපි අංක : 01-79 /2019

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ආයතන ප්‍රධානීන්,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත,

**"ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය - 2019"**

වර්ෂ 2011 දී ශ්‍රී ලංකාවේ පුරුෂයින්හට වැළඳුණු පිළිකා අතරින් ප්‍රමුඛතම පිළිකාව මුඛ පිළිකාව වන අතර (පිරිමින්ට වැළඳුනු සියලුම පිළිකා අතරින් 18% පමණ) ගැහැණුන්හට වැළඳුනු පිළිකා අතරින් එය හත්වන ස්ථානය ගනී. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව අළුතින් වාර්තා වන මුඛ පිළිකා රෝගීන් සංඛ්‍යාව 2000 පමණවේ. වර්ෂ 2011දී පිරිමින් සහ කාන්තාවන්ගේ වයස් ප්‍රමාණීකෘත නව මුඛ පිළිකා රෝගීන් අනුපාතය (age standardized incidence rates) ජනගහනය 100,000 කට පිළිවෙළින් 16.4 සහ 4.1 වේ. එයට අමතරව සියළුම පිළිකා අතරින් වැඩිම මරණ අනුපාතිකය ඇත්තේද මුඛ පිළිකාවට වන අතර එය දිනකට මරණ 2-3 පමණ වේ.

බුලත්විට සැපීම නැවැත්වීම, දුම්කොළ හා පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයෙන් වැළකීම, දුම්පානය සහ මත්පැන් භාවිතයෙන් වැළකීම මඟින් මුඛ පිළිකා වළක්වා ගත හැකිය. එමනිසා මහජනතාව දැනුවත් කරන වැඩසටහන් පැවැත්වීමත්, මුඛ පිළිකා සඳහා වැඩි අවදානම් සහිත කණ්ඩායම් පරීක්ෂා කිරීමත් මගින් මුඛ පිළිකා ව්‍යසනය අවම කරගත හැකිය. මුඛ පිළිකා මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමෙන් ඒවා සුව කරගත හැකි අතර පූර්ව මුඛ පිළිකා අවස්ථාවේදී රෝගය හඳුනාගෙන නිසි පරිදි රෝග කළමනාකරණයෙන් මුඛ පිළිකා සෑදීම වලක්වාගත හැකිය.

මුඛ පිළිකාවන් නිවාරණය සහ පාලනය කිරීම නොයෙකුත් ක්‍රමෝපායන් භාවිතා කලද, මුඛ පිළිකා රෝගීන් වැඩි සංඛ්‍යාවක් හඳුනා ගැනෙන්නේ රෝගයේ අවසන් අවධි වල බැවින් එම රෝගීන්ගේ මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පවතී. වර්ෂ 2011 දී නිකුත් කරන ලද නව පිළිකා දත්ත වාර්තාවට අනුව මුඛ පිළිකා රෝගීන්ගෙන් 76.5% සෞඛ්‍ය ආයතනවලට යොමුවී ඇත්තේ පිළිකා රෝගයේ තුන්වන සහ හතරවන අවධි වලයි. මේ සඳහා ප්‍රධාන හේතුව වශයෙන් අවදානම් කණ්ඩායම් නිසි පරිදි හඳුනා ගත නොහැකි වීම, පූර්ව මුඛ පිළිකා / මුඛ පිළිකාවන් හඳුනාගැනීම සඳහා සිදුකරන පරීක්ෂා පහසුකම්වල දුර්වලතා සහ මහජනතාවගේ මුඛ පිළිකා සම්බන්ධව නොදනුවත්භාවයයි.

හිස සහ ගෙල ආශ්‍රිත පිළිකාවල ඵලදායී සත්කාරය සහ පාලනය පිළිබඳ අවධානය යොමු කිරීමට ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සෑම වර්ෂයකම ජූලි 27 දින ලොව පුරා සමරනු ලැබේ. හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා අතරින් ප්‍රමුඛ ස්ථානයක් හිමි වනුයේ මුඛ පිළිකාවන්වලටයි.